

# ඉරුවාරදයෙන් මිදෙන්නේ කෙසේ ද?

**වෛද්‍ය සන්ජේ ගුප්ත**

මේ දිනවල සකල ලෝකයට ම, විශේෂයෙන් ඇමරිකා එක්සත් ජනපදයට බරපතල හිසරදයක්ව පවතින රෝගයක් ඇත. එය ඉරුවාරදය යි. මෙම රෝගය ඇමරිකා එක්සත් ජනපදය තුළ කෙතරම් තදින් ව්‍යාප්ත වී ඇත්දැයි කිවහොත් මිලියන 28 ක් වූ ඇමරිකානු ජනගහණයෙන් අඩකටත් වඩා දැනටමත් ඊට ගොදුරු වී අවසාන ය. ලොව ලොකුම බලවතාගේ ලොකුම හිසරදය බවට පත්ව ඇති මෙම රෝගය සතු එක් විශේෂත්වයක් වනුයේ උක්ත රෝගීන් අතුරින් මිලියන 9 ක පමණ ජනයාට දැනට වෙළෙඳපොලේ පවතින ඖෂධවලින් කිසිදු සහනයක් නොලැබී ම ය. (මෙබඳු ඖෂධයන් අතරට 'සෙරොටොනින්' වැනි මොළයේ රසායන ද්‍රව්‍ය හසුරුවන විෂාද නාශකයන් ද, හෘද ස්පන්දනය වැඩිකරන්නාවූ උත්තේජකයන් මග අවුරාලන ඖෂධ වර්ග ද කැල්සියම් වහනය අවුරාලන ඖෂධ වර්ග මෙන්ම වේදනා නාශකයන් ද ඇතුළත් වේ.)

නමුත්, භාග්‍යකට මෙන් සියලුදෙනා සතුසාලන සතුටුදායක පුවතක් මුළු මහත් ඇමරිකාව ම සලිත වී ඇත. විස්තරාත්මකව විග්‍රහ කළහොත් එම සුහාරංචිය නම්, ඇමරිකානු එක්සත් ජනපදයේ මේ වනවිට ක්‍රමයෙන් ප්‍රචලිත වෙමින් පවතින ඖෂධයක් මාර්ගයෙන් ඉරුවාරදයෙන් අත්මිදිය හැකි බව ය. මෙබඳු විශ්මකර්මයක් කළ හැකි ජීවකයා බවට පත්ව සැමගේ පැසසුම් ලබනුයේ අන් කිසිවක් නොව "බොටොක්ස්"(botox) නමැති ඖෂධය යි.

"බොටොක්ස්" ඖෂධය වෙළෙඳපොළට පැමිණීමෙන් අනතුරුව ක්‍රමක්‍රමයෙන් වෛද්‍යවරු එය අත්හද බැලූහ. පුදුමයකට මෙන් එබඳු අත්හදබැලීම් වැඩිපුර ගෙනදුන්නේ සාර්ථක ප්‍රතිඵලයන් ය. 'බොටොක්ස්' වෙළඳපොළට පැමිණීමෙන් වසර 2 ක් පමණ ඇවෑමෙන් උතුරු කැලිෆෝනියාවේ 'වේක් ෆොරස්ට්' විශ්වවිද්‍යාලීය නියෝජිත පිරිසක් විසින් එම ඖෂධය පිළිබඳව විද්‍යාත්මක පර්ෂේණයක යෙදුනි. අනෙකුත් විවිධාකාර ඖෂධ මගින් කිසිදු සුවයක් නොලද ඉරුවාරද රෝගීන් 134 දෙනකු අරබයා කෙරුණු මෙම පර්යේෂණය මුලු මහත් ලෝකයේ ම ඉරුවාරද රෝගීන්ගේ හිසරදයන් තුරන් කිරීමට සමත් විය. බොටොක්ස් මගින් සාමාන්‍ය ප්‍රතිකාර ලද රෝගීන්ගෙන් 84% තත්ත්වය වඩා යහපත් අතට පරිවර්තනය වූ අතර, දැඩි ප්‍රතිකාර ලද රෝගීන්ගේ මෙම ප්‍රතිශතය 92% දක්වා ඉහළ නැගිණි.

'බොටොක්ස්' පිළිබඳ පර්යේෂණයන්හි ප්‍රධානියකු වන උක්ත විශ්වවිද්‍යාලයේ ස්නායුවේද අධිපති, වෛද්‍ය වොඩ් ටෲස් මහතාගේ මතය අනුව 'බොටොක්ස්' ඖෂධය, මිනිස් සිරුර තුළ ප්‍රතික්‍රියා කරන ආකාරය මතභේදයනට තුඩු දේ. 'බොටොක්ස් ඖෂධයෙන් හිසේ, බෙල්ලේ සහ හක්කේ මාංශ පේශීන් සැහැල්ලු බවට පත් වේ. මෙම තත්ත්වයන් යටතේ ඉරුවාරද ප්‍රවණතාවයන් ඇතිවීම මග හැරේ. එමෙන්ම බොටොක්ස් මගින් මොළයේ වේදනා පිළිබඳ සන්නිවේදනයන් දක්වන යාත්‍රණයට බාධා පැමිණ වේ. ඒ වෛද්‍ය වොඩ් ටෲස් මහතාගේ අදහස යි.

මේ සියල්ල මධ්‍යයේ ඇමරිකා එක්සත් ජනපද ආහාර සහ ඖෂධ සංගමය අප්‍රේල් මසදී බොටොක්ස් එන්නත හඳුන්වාදී ඇත්තේ ඉරුවාරදය නිසා ඇතිවන නළලේ රැළි ඉවත්කරන්නා වූ එන්නතක් වශයෙන් පමණි. එම එන්නත ඉරුවාරදයට පිළියම් ක්‍රමයක් ලෙස ඔවුන් විසින් මෙතෙක් හඳුන්වාදී නොමැත. ඒ කෙසේ නමුත් මෙම එන්නත බාහිර ප්‍රතිකාර ක්‍රමයක් වශයෙන් රෝගීන්ට නියම කිරීමේ අවසරය වෛද්‍යවරුන් සතුව ඇත.

බොටොක්ස් එන්නත රෝගියෙකුට ලබාදීම ද ලෙහෙසි පහසු කටයුත්තක් නොවේ. එන්නත් එන්නත් කළ යුත්තේ හිස, බෙල්ල, හක්ක, උරහිස් සහ ශංඛය (නළල සහ කන අතර පෙදෙස) යන තැන්වලට ය. ඇමරිකානු ඩොලර් 1000 ක් හෝ ඊට අධික වියදමක් දරා ලබා දිය යුතු මෙම එන්නත මාස 3 ක හෝ 4 ක කාලසීමාවක ඇවෑමෙන් ඉරුවාරදය ක්‍රමයෙන් පහකිරීමට ඉවහල් වේ. ඒ කෙසේ නමුත් සමහර ඉරුවාරද රෝගීන් තවමත් රෝගී සුවය සඳහා භාවිතා කරනුයේ එතරම් පිළිගත නොහැකි අප්‍රකට වූ සම්ප්‍රදායික ක්‍රියාමාර්ගයන් ය. අධික ලෙස නිදගැනීම, රත්වත් වයින් පානයෙන් වැළකීම, චොකලට් සහ කල්ගත වූ චීස් අනුභවයෙන් වැළකීම ඒ අතුරින් කිපයකි.

කෙසේ නමුත් ඉරුවාරදය මිහිපිටින් තුරන් කිරීමේලා 'බොටොක්ස්' ලබා දෙන දායකත්වය ඉමහත් ය. බොහෝ විට 21 වන සියවසේ අපල ද විද්‍යාත්මක ජයග්‍රහණයෙන් මූලික වූ ස්ථානයක් බොටොක්ස් විසින් දිනා ගන්නවා නොඅනුමාන ය. බොටොක්ස් ඖෂධය පිළිබඳව 52 වන වියේ පසුවන 'ෂර්ල් කෙනඩි' මහත්මියගේ ගුණවැනුමකින් මෙම ලිපිය අවසන් කරමි. වසර තිහක තරම් විශාල කාල පරිච්ඡේදයක් තුළ ඉරුවාරදයෙන් මා උග්‍ර පීඩා වින්දෙ. මාගේ සෑම හිසකෙසක්ම හිසෙන් ගැලවී යනවාක් මෙන් දැඩි වේදනා සැමද මා දවාලූවා. නමුත් දේව භාසකමකින් මාගේ කාලකණ්ණි වූ ජීවිතයෙන් මා මිදුනා. මා ඉන් මුදගත් මහාතාර්ඝ ඖෂධය වූයේ වෙනකක් නොවේ 'බොටොක්ස්' ය. ❑

**අනුවාදය**
**රුවන් නන්දික**

'ටයිම්' සඟරාව ඇසුරිනි.